රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය    இணைந்த சேவைகள் பிரிவு    COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.    சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.    Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: (94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: www.pubad.gov.lk / Web Site

---

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: CS/DOS/22/02/01 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2016.04.04 |

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත**

**<u>සංවර්ධන නිලධාරී පත්වීම් ස්ථිර කිරීම.</u>**

අංක1774/31 දරන හා 2012.09.07 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1745/11 දරන හා 2012.02.14 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් පළකරන ලද ශ්‍රී ලංකා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර කිරීමට කටයුතු කෙරෙමින් පවතී. ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන සියළුම සංවර්ධන නිලධාරීන්ට අදාළව (ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ද ඇතුළුව) දේශීය/විදේශීය විශ්ව විද්‍යාල මගින් උපාධිය සනාථ කරවාගැනීමට කඩිනමින් කටයුතු කරන මෙන් ද මෙහිදී, එම ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපිය පෞද්ගලිකව ඔබ නමට ගෙන්වා ගැනීමට කටයුතු කරන මෙන්ද දන්වමි.

එසේ ඔබ විසින් උපාධි ප්‍රතිඵල සනාථ කරගන්නා ලද ලිපියෙහි මුල්පිටපත, පත්වීම් ස්ථිර කිරීම සඳහා අප වෙත එවිය යුතු ලිපිලේඛන සමඟ ස්ථිර කිරීමේ නිර්දේශය සහිතව මා වෙත එවීමට කටයුතු කරන්න.

එහිදී එවිය යුතු ලේඛන පිළිබඳ විස්තර ඇතුලත් ලිපි www.pubad.gov.lk අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කර ඇති බවද සඳහන් කරමි.

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**

**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්**